www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකා ආන්ඩුව දෙමල පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට තර්ජනය කරයි

## Sri Lankan government threatens Tamil parliamentarians

**කේ. රත්නායක විසිනි**

**2009 ජූනි 16**

දෙමල පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 4 දෙනෙක් විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද නිවාඩු ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කිරීම මගින් ඔවුන් පාර්ලිමේන්තුවෙන් නෙරපා දැමීමට ශ්‍රී ලංකා ආන්ඩුව විසින් පසුගිය සතියේ දී තර්ජනය කර සිටියේය. ශ්‍රී ලංකා හමුදාව විසින් දෙමල ඊලම් විමුක්ති කොටි සංවිධානය පරාජය කිරීමත් සමඟ එලැඹෙමින් පවතින, මොනයම්ම හෝ දේශපාලන විරුද්ධත්වයක් මර්දනය කිරීමට රාජපක්ෂ ආන්ඩුවේ අභිලාෂය පිලිබඳ තව දුර සලකුනක් මෙම තර්ජනය මගින් ඇඟවුම් කරයි.

දෙමල ජාතික සන්ධානයේ තම මන්ත්‍රීවරුන් හතර දෙනෙකුගේ - සෙල්වම් අඩෛයිකලනාදන්, සෙල්වරාජ් ගජේන්ද්‍රන්, එස්. ජෙයනන්දමූර්ති සහ පී. සම්බන්ධන් - නිවාඩු ඉල්ලුම් පත්, පසුගිය ජූනි 10 වෙනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කල අවස්ථාවේ මතභේදය ඉස්මත්තට පැමිනියේ ය. මන්ත්‍රීවරුන් හතර දෙනා මාස තුනක් සඳහා නිවාඩු ලබා තිබූ අතර, එය තවත් මාස තුනකින් දීර්ඝ කර ගැනීම අරමුන විය.

පවතින දෙමල පාර්ලිමේන්තු පක්ෂවලින්, ''දෙමල ජනයාගේ එකම නියෝජනය '' තමා යැයි එල්ටීටීඊයේ ව්‍යාජ කියාපෑම පිලිගත්තාවූ, දෙමල ජාතික සන්ධානය ; 2002 සටන් විරාමයට පූර්වයෙන්, 2001 වසරේදී පිහිටුවාගනු ලැබීය. ප්‍රතිඵලයක් වශයෙන් දෙජාසය එල්ටීටීඊය වෙනුවෙන් පෙරකදෝරුවෙක් වශයෙන් ක්‍රියාකරනු ලැබීය. එල්ටීටීඊයේ මිලිටරි පරාජය වූ මොහොතේ සිට, තමන් ශ්‍රී ලංකාවේ දෙමල ජනයා වෙනුවෙන් ස්වයං-නීර්න අයිතිය අඛන්ඩව ඉදිරියටත් පවත්වා ගන්නා බව ප්‍රකාශ කලේ ය.

සාමාන්‍යයෙන් පාර්ලිමේන්තු නිවාඩු ඉල්ලීම් සරල නිල ක්‍රියාමාර්ගයකි. කෙසේ වෙතත්, මෙම සිද්ධියේ දී දෙමල ජාතික සන්ධානයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හතර දෙනාට තර්ජනය කිරීමට රාජපක්ෂ ආන්ඩුව අවස්ථාව ඩැහැ ගත්තේ ය. ශ්‍රී ලංකා ව්‍යවස්ථාවේ විධි විධානයන්ට අනුකූලව නිවාඩු අනුමත නොකලේ නම් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට තමන්ගේ පාර්ලිමේන්තු අසුන අහිමි වන්නේ ය.

නිවාඩු ඉල්ලීම ඉදිරිපත් කලඅවස්ථාවේදී; ආන්ඩුව මෙම ඉල්ලීමට විරුද්ධ වන බව ආන්ඩුවේ ප්‍රධාන සංවිධායක, දිනේශ් ගුනවර්ධන ප්‍රකාශ කලේ ය. පාර්ලිමේන්තු සම්ප්‍රදාය අනුව නිවාඩු ලබා දීම ප්‍රශ්න කල නොහැකි බව හොඳින්ම දැනුවත් ව සිටි අතරේ, ඔහු, ''විදේශ මාධ්‍යයන්ට සාවද්‍ය ප්‍රකාශ ලබා දීමට'' රාජ්‍යතාන්ත්‍රික බලපත්‍ර මගින් විදේශයන්ට ගමන් කරමින් ''ශ්‍රී ලංකා ව්‍යවස්ථාවට එරෙහිව ක්‍රියා කිරීම '' පිලිබඳව දෙජාසයට චෝදනා නැගීය.

ආන්ඩුවේ ඇමතිවරුන් වන හේමකුමාර නානායක්කාර සහ ජගත් පුෂ්පකුමාර (ජවපෙ)දෙමල ජාතික සන්ධානයට තඩිබෑවෝය. ජනතා විමුක්ති පෙරමුනෙන් කැඩුන සිංහල ස්වෝත්තමවාදී ජාතික නිදහස් පෙරමුනේ (ජානිපෙ) විමල් වීරවංශ ද ඔවුන්ට අත්වැල් සැපයීය. ''මෙම මිනිසුන් රාජ්‍යතාන්ත්‍රික විදෙස් ගමන් බලපත්‍ර හා පාර්ලිමේන්තු වරප්‍රසාදයන් යොදා ගනිමින් ජාත්‍යන්තරව සාවද්‍ය ප්‍රචාරයක් ගෙනයති.'' විමල් වීරවංශ කීවේය.

මිලිටරිය දෙමල ජනයාට එරෙහි ඔවුන්ගේ දාමරිකකම් හෝ තුන් ලක්ෂයකට ආසන්න දෙමල ජනයා ගාල් කොට ඇති රැඳවුම් කඳවුරු පිලිබඳ මොනයම්ම හෝ විවේචනයක් මැඩීමට ආන්ඩුව අදිටන් කර සිටී. මෙම යුද අපරාධයන්ට හා ප්‍රජාතාන්ත්‍රික අයිතීන් කෙලෙසීමට එරෙහි ඕනෑම විරෝධයක් ''ත්‍රස්තවාදයට'' සහාය පල කිරීමක් හා රාජ අපරාධයකට සමාන කොට රාජපක්ෂ ආන්ඩුව විසින් සලකනු ලබයි.

එල්ටීටීඊයේ පරාජයෙන් කෙටි කලකට පසු ව දෙජාසයට එරෙහි ප්‍රකෝපකරනය, ජනාධිපති සොහොයුරු, ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ විසන් කල් තියාම ඉඟි කර සිටියේ ය. ''දෙමල ජාතික සන්ධාන මන්ත්‍රීවරුන් වැඩි කාලයක් ජීවත් වන්නේ රටින් පිටත වන අතර දෙමල ජනයා සංහාරය කිරීමක් සිදු වන්නේ ය (කියාපෑම) ප්‍රචාරය කරති. ඔවුන්ට එරෙහිව නෛතික ක්‍රියාමාර්ග ගැනීමට සිදු වෙනු ඇත. පාර්ලිමේන්තුව නියෝජනය කිරීමට කිසිදු අයිතියක් ඔවුන්ට නැත''යි මැයි 21 වෙනි දින රාජ්‍ය පාලිත අයිටීඑන් නාලිකාවේ කතා කරමින් කියා සිටියේ ය.

ගෝඨාභය රාජපක්ෂ යටතේ, ආරක්ෂක අමාත්‍යාංශය මූලික ප්‍රජාතාන්ත්‍රික අයිතීන්ට ප්‍රහාර එල්ල කිරීමේ පෙරමුන ගෙන සිටී. ආරක්ෂක හමුදාවන්ගේ රහසිගත පිටුබලය ලැබ ක්‍රියාත්මක වන ආන්ඩුව-හිතැති ඝාතක කල්ලි විසින්, පසුගිය වසර තුන තිස්සේ දේශපාලඥයින් සහ මාධ්‍ය වේදීන් ඇතුලු මිනිසුන් සිය ගනනක් පැහැරගෙන ගොස් හෝ මරා දමා ඇත. යුද්ධය අවසානයේ සිට'එල්ටීටීඊ යේ පඩි ලැයිස්තුවේ' 'පසුවී යයි චෝදිත 'රාජ්‍ය ද්‍රෝහීන්ට' සහ මාද්‍යවේදීන්ට එරෙහිව ආන්ඩුව සහ හමුදාව විසින් තව දුරටත් තර්ජනය කර සිටිති.

සැලකිය යුතු අයුරින් ප්‍රධාන විරුද්ධ පක්ෂය, එක්සත් ජාතික පක්ෂය (යූඇන්පී), යුද්ධයට සහ වාර්ගික ජයග්‍රහනවාදය කෙරෙහි ආන්ඩුවේ අනුක්‍රමනික මෙහෙයුම සඳහා තමන්ගේ සහය ඇඟවුම් කරමින්, දෙජාස මන්ත්‍රීවරුන්ට එරෙහි ආන්ඩුවේ ප්‍රකෝපකරනයට ප්‍රතිචාර දැක්වීමේ දී තවමත් මුනිවත රකිමින් සිටී.

පාර්ලිමේන්තු කතා නායක විජමු ලොකුබන්ඩාර නිවාඩු ඉල්ලුම්පත් අනුමත කලේ ය. දෙජාස මන්ත්‍රීවරුන් වෛද්‍ය සහතික ඉදිරිපත් කල බවත් නිල වශයෙන් ඔවුන්ගේ නිවාඩු අනුමත කල බවත්, පසුගිය සිකුරාදා පාර්ලිමේන්තුවට දැනුම් දුන්නේ ය. තමන්ගේ තර්ජනය පවත්වා ගැනීමට නොහැකි අතරේ, ආන්ඩුව, දෙජාස මන්ත්‍රීවරුන් පාර්ලිමේන්තු මන්ත්‍රීන් පාර්ලිමේන්තුවෙන් පලවා හැරීමට විවිධාකාර ව්‍යාජෝක්තීන් පාවිච්චි කරනු ඇති බවට ඇඟවුම් කර ඇත.

ප්‍රභූව වඩාත් පුලුල් අර්ථයෙන් පාර්ලිමේන්තු උපාමාරුව, දෙමල බෙලහීන කිරීමේ සහ විනයගත කිරීමේ අරමුනින් යුතුව කෙරුනකි. දෙජාසයේ ප්‍රමුඛ සංරචකය වන්නේ, 1948 නිදහසින් අනතුරු ව කෙටි කලකින් පිහිටුවා ගනු ලැබූ පූර්වයෙන් පෙඩරල් පක්ෂය, ධනේශ්වර දෙමල එක්සත් විමුක්ති පෙරමුනයි (ටීයූඑල්එෆ්). ටීයූඑල්එෆ් පාර්ලිමේන්තු ඉදිරිදර්ශනය අසමර්ථ වී ඇතැයි තීන්දු කර ගත් තරුන තට්ටු අතරින් 1970 ගනන්වල දී එල්ටීටීඊය සහ අනෙකුත් සන්නද්ධ බෙදුම්වාදී කල්ලි සහාය එක්රැස් කර ගත්තේ ය.

දෙජස මන්ත්‍රීවරුන් පාර්ලිමේන්තුවෙන් නෙරපා දැමීමට ආන්ඩුවේ තර්ජනය සහ දෙමල සුලුතරයේ සැලකියයුතු කන්ඩායමක ඡන්ද බලය අහිමි කිරීමට එල්ටීටීඊයට විරුද්ධ යුද්ධයේ වාර්ගික ස්වභාවය මැනවින් විදහා දක්වයි. 'ත්‍රස්තවාදයට එරෙහි යුද්ධයක්' වීමෙන් බොහෝ දුරස්ථ; 1983 දී ගැටුම පිපිරී ගියේ, එකකට එකක් පසුව පැමිනි කොලඹ ආන්ඩුවල දශක ගනනාවක දෙමල විරෝධි වෙනස්කම් කිරීමවලට ප්‍රතිචාරයක් වශයෙනි.

දෙමල ජනයාට එරෙහි විෂකුරු මෙහෙයුමක් ගෙනගිය යූඇන්පී ආන්ඩුවේ අභිමතය අනුව ක්‍රියා කරමින් 1983 දී සිංහල වර්ගවාදී දාමරිකයන් විසින් දහස් ගනනක් දෙමල මිනිසුන් මරා දැමූ අතර නිවාස සහ ව්‍යාපාරයන් විශාල ප්‍රමානයක් දවා අලු කර දැමූහ. දින කීපයක් තුල දී ජනාධිපති ජේආර් ජයවර්ධන හයවැනි ව්‍යවස්ථා ප්‍රතිසංස්කරනය පාර්ලිමේන්තුව හරහා ව්‍යවස්ථාවට රිංගවනු ලැබීය.

හයවැනි ව්‍යවස්ථා ප්‍රතිසංස්කරනය මගින් වෙනම දෙමල රාජ්‍යයක් වෙනුවෙන් මොනයම්ම හෝ දේශපාලන ප්‍රචාරක වැඩ පිලිවෙලක් ගෙන යාම තහනම් කරන ලද අතර එය (තහනම) ශක්තිමත් කිරීමට නීති පනවනු ලැබීය. සියලුම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට සහ රාජ්‍ය සේවයන් ව්‍යවස්ථාවට තම අවනත භාවය දැක්වීමේ දිව්රීමක් කිරීමට බල කර සිටිනු ලැබීය. මෙය ටීයූඑල්එෆ් විසින් ප්‍රතික්ෂේප කිරීමෙන් අනතුරුව, එහි පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 16 දෙනා පාර්ලිමේන්තුවෙන් නෙරපා දමන ලදී. ආන්ඩුව දෙමල ප්‍රභූව සමග එකඟතාවට කැමැත්තක් නැතැයි පැහැදිලි කර, ව්‍යවස්ථා ප්‍රතිසංස්කරනය, පැහැදිලිව යුද්ධය ප්‍රකාශ කිරීමට සමාන කොට සලකනු ලැබීය.

දෙමල ජාතික මන්ත්‍රීවරුන් පාර්ලිමේන්තුවෙන් නෙරපා දැමීමට ආන්ඩුවේ තර්ජනය ඉලක්ක කර ඇත්තේ රටේ දෙමල සුලුතරයට පමනක් නොව පලල් වශයෙන් වැඩ කරන ජනයාගෙන් එල්ල වන ඕනම දේශපාලන විරුද්ධත්වයක් එය විසින් තර්ජනයට ලක් කරනු ඇත. ගැඹුරුවන ආර්ථික අර්බුදයට මුහුන දෙමින් මහින්ද රාජපක්ෂ දැනටමත් 'ජාතිය ගොඩනැගීම' සඳහා කැප කිරීමට කම්කරුවන් සහ තරුනයන්ට කැඳවුම් කර තිබේ. එල්ටීටීඊයේ පරාජය සැමරීමට උසිගන්වමින් පවතින වාර්ගිකවාදයේ මෙහෙයුම පිටුපසින් කම්කරු පන්තිය මත, ප්‍රජාතාන්ත්‍රික අයිතීන් තව දුරටත් පාගා දැමීම මගින් පමනක් ක්‍රියාත්මක කර හැකිදැවැන්ත ප්‍රහාරයකට ආන්ඩුව සූදානම් වෙමින් සිටී.

© www.wsws.org